අධ්‍යාපන අමාත්‍යාංශය

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020 (2021 මාර්තු)**

**බුද්ධ ධර්මය විෂය ප්‍රවර්ධන උපකාරක ප්‍රශ්න පත්‍රය**

## පිළිතුරු පත්‍රය

## (I කොටස)

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 11 | 2 | 21 | 1 | 31 | 4 |
| 2 | 2 | 12 | 3 | 22 | 1 | 32 | 3 |
| 3 | 4 | 13 | 4 | 23 | 3 | 33 | 1 |
| 4 | 3 | 14 | 3 | 24 | 2 | 34 | 3 |
| 5 | 2 | 15 | 1 | 25 | 2 | 35 | 2 |
| 6 | 4 | 16 | 2 | 26 | 2 | 36 | 3 |
| 7 | 3 | 17 | 1 | 27 | 4 | 37 | 3 |
| 8 | 2 | 18 | 1 | 28 | 1 | 38 | 4 |
| 9 | 2 | 19 | 4 | 29 | 4 | 39 | 1 |
| 10 | 1 | 20 | 4 | 30 | 1 | 40 | 3 |

ලකුණු 01 x 40 = 40 යි

| | | |
|---|---|---|
| 01. | I | භද්‍ර වනය (10-16) |
| | II | බුදුරජාණන් වහන්සේ සසර දුකට පිළියම් උගන්වන හෙයින් වෛද්‍යවරයෙකි (11-15) |
| | III | මල් පලතුරු උයන් වවන්නේ ද, ස්වාභාවික වනාන්තර වවන්නේ ද, ඒදඬු, පාලම්, පැන්හල්, පොකුණු තනාදෙයි ද, ඔවුනට දිවාරය පින් වැඩේ. මෙම කරුණු අතරින් දෙකක් (11-14) |
| | IV | ගේහසිත සීලය/ නිත්‍ය සීලය/ පන්සිල් (11-15) |
| | V | ආබද්ධ පිළිම (11-18) |
| | VI | ද්විතීය ධර්මකීර්ති නාහිමිපාණන් වහන්සේ (11-19) |
| | VII | කෘෂිකර්මාන්තය (කසී), වෙළෙඳාම (වණිජ්ජා), ගව පාලනය (ගෝ රක්ඛ), රාජ්‍ය සේවය (රාජ පෝරිස), අනෙකුත් ශිල්ප කර්මාන්ත (සිප්පඤ්ඤතර) මෙම කරුණු අතරින් දෙකක් (11-20) |
| | VIII | භූත්තවමිතක (10-18) |
| | IX | චක්කවත්ති සීහනාද සූත්‍රය (10 - 22) |
| | X | සිල්වත් සමාගම (10-06) |
| | | |
| 2. | I | **චේතනාහං භික්ඛවේ කම්මං වදාමි** (11-11) |
| | II | සචේතනික කාය කර්ම, සචේතනික වචී කර්ම, සචේතනික මනෝ කර්ම (11-11) |
| | III | • තමාටත්, අනුනටත්,මෙලොවටත්, පරලොවටත් වැඩදායි ක්‍රියා හොඳ ක්‍රියා හෙවත් යහපත් ක්‍රියා වශයෙන් ද තමාටත්, අනුනටත්,මෙලොවටත්, පරලොවටත් අවැඩදායි ක්‍රියා නරක ක්‍රියා හෙවත් අයහපත් ක්‍රියා වශයෙන් ද හැඳින්විය හැකි ය.<br>• යමක් කිරීමට පෙර තමා කරන කටයුත්ත මෙම නිර්ණායකයන්ගෙන් කවරකට අයත් දැ යි සිතා විමසා ක්‍රියා කිරීමෙන් ප්‍රඥාවන්ත තීරණවලට එළඹිය හැකි ය.<br>• බොහෝ ශිෂ්‍යයින් දුරදිග නොබලා කරන කටයුතු හේතුවෙන් ඔවුන් මෙන්ම ඔවුන්ගේ දෙමාපියන් හා |

| | | |
|---|---|---|
| | | ගුරුවරුන් ද අපහසුතාවයට පත්වන අවස්ථා බොහෝ ය. නිදසුන් ලෙස පාසල් වයසේ ප්‍රේම සබඳතා පැවැත්වීම, පාසල් කාලය තුළ අනවසරයෙන් බැහැරයාම, නරක මිතුරන් ඇසුරු කිරීම, අවදාම් කටයුතුවල නියැලීම, මත්ද්‍රව්‍ය භාවිතය ආදිය ඉන් කිහිපයක් ලෙස දැක්විය හැකි ය..<br>• එබැවින් එළඹ සිටි සිහියෙන් යුතු ව කටයුතු කිරීමත්, තමා කවු ද යන්න හඳුනා ගැනීමත්, ශිෂ්‍ය ජීවිතයට ගැළපෙන දේ පමණක් තෝරා ගැනීමත්, තම අධ්‍යාපනය හා ශිෂ්‍ය විනය කෙරෙහි මූලික අවධානය යොමුකොට ක්‍රියා කිරීමත් අතිශයින් වැදගත් වේ.<br>• ගුරු බසට හා වැඩිහිටි අවවාදවලට ඇහුන්කන් දීම ත්, වයසට ගැළපෙන මිතුරු ඇසුරත්, විවේකය ඵලදායී ව ගත කිරීමත් සිතා විමසා තීරණ ගැනීමත් තුළින් ශිෂ්‍ය ජීවිතය ආදර්ශවත් කරගත හැකි ය. |
| | | |
| 3. | I | සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානිච<br>යංවේ හිතං ච සාධුං ච - තං වේ පරම දුක්කරං (අත්ත වග්ග 7 ගාථාව) :11-6 |
| | II | තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසු ය. යම් දෙයක් තමාට වැඩදායක ද යහපත පිණිස හෝ පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසු ය. :11-6 |
| | III | ■ සියලු සත්ත්වයෝ වරදට පෙළඹෙන ස්වභාවයෙන් යුතුය. ඒ අතර දරුවන් වැඩි වශයෙන් වැරදි කිරීමට යොමු වන්නේ අනවබෝධය, වැඩිහිටි නොසැලකිල්ල, පාරසරික හා සමාජ ගැටලු අයහපත් මිතුරු ඇසුර තාක්ෂණය අවභාවිතය ආදිය හේතුවෙනි.<br>■ එමගින් දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම, මව්පිය වැඩිහිටි අවවාද නොසැලකීම, ගුරුවරුන්ට හා වැඩිහිටියන්ගේ අවවාද නොසැලකීම, විභාග අසමත් වීම, සමාජ විරෝධී කණ්ඩායම් බිහිවීම ආදිය සිදුවන අතර මෙවැනි ක්‍රියා තුළින් තම අධ්‍යාපනයත් ජීවිතයත් කඩාකප්පල් කරගන්නා ඔවුන්ට අවසානයේ අසරණ ව සිරගෙවල් තුළ අවසන් හුස්ම හෙළන්නට සිදු වේ.<br>■ එනිසා අපහසුවෙන් වුවද වරදින් මිදී කටයුතු කළ යුතු අතර එසේ වරදින් මිදී කටයුතු කිරීමේ දී සමාජයෙන් විවිධ බලපෑම් පවා එල්ලවීමට ඇති ඉඩකඩ වැඩි ය. එසේ වුවද එවා මැඩගෙන ඉදිරියට ම යා යුතු ය.<br>■ වරදට සිත පෙළඹෙන විට යහපත් විකල්ප ක්‍රියා අනුගමනය කළ හැකි අතර ඒ සඳහා පුස්තකාල භාවිතය සිල් සමාදන් වීම බුදුන් වැඳීම , කළණ මිතුරන් ඇසුරු කිරීම ආදිය ඉතා යෝග්‍ය වේ<br>■ අපහසුතා මධ්‍යයේ වුවද යහපතෙහි යෙදීමෙන් මෙලොව පරලොව දියුණුව ඇති වේ |
| | | |
| 4. | I | සම්බුද්ධ පරිනිර්වාණයෙන් 236 වන වසරෙහි එනම් දෙවනපෑතිස් රජතුමාගේ පළමු රාජ්‍ය වර්ෂයේ හෙවත් ධර්මාශෝක අධිරාජයාගේ 18 වැනි රාජ්‍ය වර්ෂයේ දි යග :11-17 |
| | II | දුමින්දාගමනය යනුවෙන් හැඳින්වෙන්නේ දඹදිව බුද්ධ ගයාවෙහි වැඩසිටින ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව මෙරටට වැඩම වීමයි. :11-17 |
| | III | මහින්දාගමනය සිදු වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් 236 වන වසරෙහි එනම් දෙවනපෑතිස් රජතුමාගේ පළමු රාජ්‍ය වර්ෂයේ හෙවත් ධර්මාශෝක අධිරාජයාගේ 18 වැනි රාජ්‍ය වර්ෂයේ යැයි සැලකේ.<br><br>මිහිඳු මාහිමියන් විසින් මෙරටට ගෙන එන ලද බුද්ධ ධර්මයත්, බෞද්ධ සංස්කෘතියත්, මෙරට ජන සමාජය, රාජ්‍ය පාලනය, ආර්ථිකය, අධ්‍යාපනය, භාෂාව, සාහිත්‍යය, කලා ශිල්ප, සිරිත් විරිත්, ඇදහිලි, පුද පූජා, විශ්වාස හා සාරධර්ම ද ගොඩනගමින් පුළුල් ලෙස ලාංකේය සංස්කෘතිය පෝෂණය කරන ලදී.<br><br>ඒ අනුව මහින්දාගමනයත් ඊට ම එක් වූ දුමින්දාගමනයත් දේශීය බෞද්ධ සංස්කෘතියේ ආරම්භයයි. මිහිඳු මාහිමියෝ අලුත් ආගමක් පමණක් නොව ඒ වනවිටත් ගොඩනැගී තිබූ කීර්තිමත් සභ්‍යත්වයක් ද මේ රටට දායාද කළහ. එය බෞද්ධ ඉගැන්වීම් පදනම් කොට ගත්තකි.<br><br>බුදුදහමත්, එම සංස්කෘතියත් මෙරට තහවුරු කිරීමට මිහිඳු මාහිමියන්ගේ මනා සැලසුම්කරණය, කැපවීම හා ක්‍රියාකාරීත්වය මෙන් ම දෙවනපෑතිස් මහරජතුමාගේ ආගමික උද්යෝගය හා නොමඳ කැපවීම ද උපකාරී වූ බවට සැක නැත.<br><br>එදා පටන් අද දක්වා ගෙවී ගිය සියවස් 25 කට ආසන්න කාලය මුළුල්ලේ ශ්‍රී ලාංකික ජන සමාජයට බුදුදහමින් ලැබුණු දැවැන්ත පෝෂණය ආරම්භ වන්නේ මහින්දාගමනයෙනි. එය පහත දැක්වෙන පරිදි කරුණු වශයෙන් සම්පිණ්ඩනය කළ හැකි ය.<br><br>●ලක්දිව ථේරවාද බෞද්ධ මූලස්ථානය වූ මහා විහාරය මහමෙවුනාවෙහි පිහිටුවීම හා එම ආදර්ශය ඔස්සේ අනුක්‍රමයෙන් ලක්දිව සියලු ගම් නියම්ගම්වල වෙහෙර විහාර ඇති වීම.<br><br>● මහා අරිට්ඨ කුමරු ද තවත් කුමාරවරුන් 500ක් ද පැවිදි කරමින් දේශීය භික්ෂු සමාජය ආරම්භ කිරීම.<br><br>● මහා විහාරය කේන්ද්‍ර කොටගත් ජාතික අධ්‍යාපන ක්‍රියාවලියක ආරම්භය හා එය සියලු විහාරාරාම ඔස්සේ ක්‍රමයෙන් පැතිර යාම. |

| | | |
|---|---|---|
| | | ● සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේගේ සම්ප්‍රාප්තිය හා එමගින් මෙරට විවිධ අංශවලට බෞද්ධ බලපෑමක් වූ ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවා රෝපණය කිරීම.<br><br>● අනුලා බිසව ප්‍රධාන රාජකීය කාන්තාවන්ට පැවිද්ද ලබාදෙමින් ලක්දිව භික්ෂුණී සමාජය ආරම්භ වීම.<br><br>● බුද්ධ ප්‍රතිමා, බෝධිසත්ව ප්‍රතිමා, සුවිසල් මහා සෑයවල් ආදිය ලක්වැසියන්ට දායාද වීම.<br><br>● ශ්‍රී ලංකාවේ විහාරාරාම ආශ්‍රිත ව චිත්‍ර, මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණ ආදි විසිතුරු හා විශිෂ්ට කලාකෘති ඇති වීම.<br><br>● භාරතීය බ්‍රාහ්මී අක්ෂර ද ආදර්ශයට ගනිමින් මිහිඳු මාහිමියන්ගේ අනුශාසනා පරිදි සිංහල අක්ෂර මාලාව සකස් කළ අතර එය ප්‍රචලිත වීම.<br><br>● බෞද්ධ මූලාශ්‍රය පාදක කොට ගනිමින් අනුරාධපුර යුගයේ පටන් ම වටිනා ගද්‍ය පද්‍ය සාහිත්‍ය කෘති සිංහල මෙන් ම පාලි නිර්මාණ ලෙස ද බිහි වීම.<br><br>● ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලකයන් බෞද්ධ ඉගැන්වීම් අනුව රට පාලනය කිරීම හා බෝසත් ආදර්ශය අනුව දැහැමි රාජ්‍ය පාලනයක් පවත්වාගෙන යාමට පෙළඹීම.<br><br>● ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික ආර්ථික ප්‍රතිපත්ති මෙන් ම පොදුජන ආර්ථික ක්‍රියාකාරකම් ද බෞද්ධ අභාසය ඇති ව සකස් වීම.<br><br>● ශ්‍රී ලංකාවේ බෞද්ධ ජන ජීවිතයට ම ආවේණික වූ වන්දනාමාන හා පුදසිරිත් පද්ධතියක් බිහි වීම.<br><br>● මෙරට ජනයාගේ විශිෂ්ට හා අනන්‍ය ලක්ෂණයක් ලෙස හැඳින්විය යුතු උසස් සාරධර්ම කෙරෙහි කැපවීමේ ගුණය වර්ධනය වීම. |
| | | |
| 5. | I | සම්මා දිට්ඨි, සම්මා සංකප්ප |
| | II | කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා |
| | III | වැරදි වෙළදාම් පහ ආදී කරුණු වලින් ඈත් වී දැහැමි රැකියාවෙන් යුක්තව නිවැරදි දිවි පෙවතක් ගත කරන ආකාරය විස්තර විය යුතුය. |
| | | |
| 6. | I | උතුරු දිසාව - හිත මිතුරන් දකුණු දිසාව - ගුරුවරුන් |
| | II | 1 මෛත්‍රී සහගත ව ක්‍රියා කිරීම<br>2 මෛත්‍රී සහගත ව කථා කිරීම<br>3 මෛත්‍රී සහගත සිත් පහළ කර ගැනීම<br>4 නිවසට පැමිණි විට සතුටින් පිළිගැනීම<br>5 ආමිසයෙන් සංග්‍රහ කිරීම |
| | III | ගිහි පැවිදි සබඳතාව සාර්ථකව ගොඩනැගුණ විට සමාජ ගැටළු අවම වන ආකාරය ගිහි පැවිදි සබඳතාවට අයත් කරුණු ඇතුළත්ව විස්තර විය යුතුය. |
| | | |
| 7 | I | සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ<br>■ උපත - 1698 ජූනි 18<br>■ ගිහි නම කුලතුංග බණ්ඩාරයි.<br>■ වයස අවුරුදු 16 දී මහනුවර සූරියගොඩ විහාරයේ වැලිවිට සරණංකර නමින් පැවිදි විය.<br>■ පැවිදි වූ දා සිට ම යැපුණේ පිඬුසිඟා වැඩීමෙන් ය. එබැවින් පිණ්ඩපාතික සරණංකර හිමි යනුවෙන් ද ගමින් ගමට වඩිමින් දහම් දෙසමින් අසරණයන්ට පිහිට වූ බැවින් අසරණ සරණ සරණංකර හිමි යන නමින් ද උන් වහන්සේ ප්‍රසිද්ධ වූහ.<br>■ පරිහානියෙන් සසුන නඟා සිටුවිය යුතු යැයි අධිෂ්ඨාන කර ශාසනමාමක පිරිස් සංවිධානය කර සිල්වත් සමාගම නමින් සංවිධානයක් පිහිටුවා ගන්නා ලදී.<br>■ සරණංකර හිමිපාණෝ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ උදවු ඇතිව උපසම්පදා භික්ෂූන් වහන්සේලා පිරිසක් මෙරටට වැඩම කර ගැනීම සඳහා දූත පිරිසක් සියම් (තායිලන්තය) රටට යැවීමට කටයුතු කළහ. |

| | | |
|---|---|---|
| | | ■ 1753 දී සියම් රටින් පැමිණි භික්ෂූන් වහන්සේ වෙතින් සරණංකර මාහිමිපාණන් ඇතුළු හය නමක් උපසම්පදා කරන ලදී.<br>■ ලක්දිව බුදු සසුන නගා සිටුවීමට කරන ලද සුවිශාල මෙහෙවරට උපහාර වශයෙන් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් සඟරජ පදවිය පිරිනමන ලදී. සිය ආරාමයට වැඩි වහා ම තල් පතක් ගෙන තමාට ම අවවාද වශයෙන් උඩඟු නොව මහණ යන වචන තුන ලියා පිවිසුම් දොරටුවෙහි අලවා තැබූහ. එමගින් බලාපොරොත්තු වූයේ තනතුරු නිසා ඇතිවන මාන්නය නැති කිරීමයි .<br><br>■ සරණංකර හිමියන්ගේ ශාසනික සේවා<br><br>උපසම්පදාව ආරම්භ කිරීමට කටයුතු කිරීම<br>උඩුනුවර නියම කන්දේ පිරිවෙනක් පිහිටුවීම<br>අනුරාධපුර, දඹුල්ල, පොලොන්නරුව ආදී බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කරවා නිසි පරිදි පුද පූජා පැවැත්වීම<br>මහනුවර පැවැත්වූ දේවාල පෙරහැරට ශ්‍රී දන්ත ධාතූන් වහන්සේට උපහාර දැක්වීමේ මාළිගාවේ මහ පෙරහැර ද එක් කිරීම.<br><br>■ සරණංකර හිමියන් රචනා කරන ලද කෘති<br>1. මුණිගුණාලංකාරය<br>2. සාරාර්ථ සංග්‍රහය<br>3. රතනත්‍රය ප්‍රණාම ගාථා සන්නය<br>4. සතර බණවර සන්නය<br><br>■ උන් වහන්සේගේ චරිතයෙන් අපට ලබා ගත හැකි ආදර්ශ<br>★ ත්‍රිවිධ රත්නය පිළිබඳ ව අපරිමිත ශ්‍රද්ධාවෙන් යුක්ත වීම<br>★ ශික්ෂාකාමී ව හා අල්පේච්ඡ ව ජීවත් වීම<br>★ විවිධ දුෂ්කරතා මැද වුවද අධ්‍යාපනය පිළිබඳ දැඩි ඇල්මක් දැක්වීම<br>★ සිසු දරුවන්ට උදවු කිරීමට තිබූ කැමැත්ත<br>★ නිරහංකාර බව<br>★ ස්ථිර අධිෂ්ඨානය |
| | II | **පුරිස දම්ම සාරථී ගුණය**<br>■ බුදුරජාණන් වහන්සේට මනුෂ්‍ය, තිරිසන්, යක්ෂල දේව, බ්‍රහ්ම ආදි සියලු සත්ත්ව සමූහයා අතුරින් නොහික්මුණු පිරිස් හික්මවා ගැනීමේ මහා බලය පුරිසදම්මසාරථී ගුණය ලෙස හැඳින්වේ.<br>■ නොහික්මුණු පිරිස් හික්මවා ගැනීම සඳහා උන් වහන්සේ භාවිත කළේ කරුණාව, මෛත්‍රිය, ඉවසීම, ප්‍රඥාව වැනි වූ ආධ්‍යාත්මික ගුණාංග ය.<br>■ පුරිසදම්මසාරථී බුදුගුණ මත පිහිටා දමනය කළ පිරිස්<br>අංගුලිමාල<br>ආලවක යක්ෂයා<br>සුචිරෝම බරරෝම වැනි යක්ෂයින්<br>නාලාගිරි හස්තිරාජයා<br>සච්චක නිගණ්ඨපුත්‍රයා<br>උපාලි ගෘහපති<br>තුන්බෑ ජටිලයන්<br>■ ආදී පිරිස් දමනය කිරීම උදාහරණ සහිතව විස්තර විය යුතුය. |
| | III | **සප්ත අපරිහානීය ධර්ම**<br>බුද්ධ කාලීන භාරතයේ ප්‍රධාන පාලන ක්‍රම දෙකකි.<br>1 රාජාණ්ඩු ක්‍රමය<br>2 සමූහාණ්ඩු පාලනය හෙවත් ගණතන්ත්‍ර පාලනය<br><br>වජ්ජි රජදරුවන් විසින් ගණතන්ත්‍ර පාලනයක් ක්‍රියාත්මක කළ බව සඳහන් වේ.<br>සප්ත අපරිහානීය ධර්ම<br>01 නිතර නිතර රැස්වීම<br>02 සමගි ව රැස් ව සමගි ව සාකච්ඡා කොට සමගිව විසිර යාම<br>03 පෙර නොපැනවූ නීති නොපැනවීම හා පනවන ලද නීති කඩ නොකොට ආරක්ෂා කිරීම<br>04 වැඩිහිටියන්ට හා ඔවුන්ගේ අදහස්වලට ගරු කිරීම<br>05 කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම<br>06 වජ්ජි රාජ්‍යය ඇතුළත හා පිටත පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම හා කඩ නොකොට පුදසිරිත් පැවැත්වීම<br>07 තම රාජ්‍යයට පැමිණි හා පැමිණෙන පූජනීය උතුමන්ට පහසුකම් සැලසීම |

| | | |
|---|---|---|
| | | මෙම අපරිහානීය කරුණු සහිත ව පිළිතුර සකස් විය යුතුය. |
| | IV | **සඳකඩපහණ**<br><br>බෞද්ධ සිද්ධස්ථානයකට පිවිසෙන පියගැට පෙළක ආරම්භයේ දක්නට ලැබෙන අර්ධකවාකාර ගල් පුවරුව හැඳින්වෙන්නේ සඳකඩපහණ නමින් ය.<br><br>පාලියෙන් "අඩ්ඪචන්දපාසාණ" යනුවෙන් ද හඳුන්වයි.<br><br>වඩාත් කලාත්මක සඳකඩපහණ නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ අනුරාධපුර යුගයේ මධ්‍ය භාගයේ විසූ කලාකරුවන්ට ය.<br><br>කලාත්මක බවින් මුල් තැන ගන්නේ අනුරාධපුරයේ බිසෝ මාලිගය අසල ඇති සඳකඩපහණයි.<br><br>කලාත්මක බව තීව්‍ර කරන ප්‍රධාන සාධකය වන්නේ එහි ඇති විසිතුරු කැටයම් ය. මල් ලියකම්වලින් මෙන් ම සත්ත්ව රූපවලින් ද සඳකඩපහණ විසිතුරු වේ.<br><br>අනුරාධපුර සඳකඩපහණ පිටත සිට ඇතුළත ඇති කැටයම්වල මුලින් ම දක්නට ලැබෙන්නේ ශෛලිගත පලාපෙති මෝස්තරයයි. අනතුරුව ඇත්තේ එකිනෙකා පසුපස දිවයන ඇත්, අස්, සිංහ, ගව යන සතුන් සිව්දෙනායි. ඉන් පසු සංකීර්ණ ලියවැලක් ද අනතුරුව තුඩින් නෙළුම් පොහොට්ටු රැගෙන එකා පසු පස ගමන් කරන හංස පේළියක් ද ඊළඟට නැවත වතාවක් සරල ලියවැලක් ද දක්නට ලැබේ.<br><br>සඳකඩපහණෙහි මැද ඇත්තේ නෙළුම් මලක අර්ධයකි.<br><br>පොළොන්නරු යුගයේ සඳකඩපහණෙහි ගව රූපය ඉවත් ව ඇත. එයට හේතුව ලෙස සැලකෙන්නේ ඒ්<br><br>වන විට හින්දු ආභාසය ලාංකේය සංස්කෘතියට එකතු වීමයි.<br><br>මහනුවර යුගයේ සඳකඩපහණ කැටයම්වලින් පමණක් නොව හැඩය අතින් ද වෙනස් වී ඇත.<br><br>අනුරාධපුර යුගයට අයත් සඳකඩපහණින් භව චක්‍රය අර්ථවත් කෙරෙන බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පවසයි. |
| | | |

ලකුණු 5+5=10